ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/S/ii/28/03/23

# මාධ්‍ය නිවේදනය

රජයේ රෝහල්වල පවතින ඖෂධ හිඟය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදු කරන පරීක්ෂණයට අදාළව පැමිණිලිකරුවන් හා වගඋත්තරකරුවන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අද දින(2023.03.28) නැවත කැඳවන ලදී.

මෙම පරීක්ෂණයේ වගඋත්තරකරුවන් වන ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යන ආයතනයන් වෙත සිතාසි යොමුකරන ලදි. ඒ අනුව මෙම පරීක්ෂණය සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශයේ ලේකම් ජනක චන්ද්‍රගුප්ත මහතා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති මහාචාර්ය එස්. ඩී. ජයරත්න මහතා සහ සෞඛ්‍යය අමාත්‍යාංශයේ සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ උසස් නිලධාරීන් සම්බන්ධ විය. මෙම පැමිණිල්ලේ පැමිණිලි පාර්ශවය ලෙස වෛද්‍ය සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සන්ධානය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය කටයුතු කරනු ලැබේ.

මෙහිදි සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉන්දියානු ණය පහසුකම යටතේ මිලදි ගත් ඖෂධ වල නාමලේඛනයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභාව වෙත ලබාදීමට කැමැත්ත පළ කළ අතර, එම ඖෂධ නාම ලේඛනය පරික්ෂාකර බලා අත්‍යවශ්‍ය නොවන ඖෂධ ඒම ලෙඛණයේ පවතී ද යන්න පිළිබඳ කරුණු කොමිෂන් සභාවට දැන්වීමට පැමිණිලි පාර්ශවය මෙහිදි කැමැත්ත පළ කරන ලදී. තවද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සාමාජිකයෝ දෙදෙනෙකු මේ වන විට පත්කර නොමැති වීම පිළිබඳ කඩිනමින් සෞඛ්‍ය අමාත්‍යවරයා සෞඛ්‍ය දැනුවත් කිරිම සිදුකරන බව සෞඛ්‍යය අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙහිදි ප්‍රකාශ කරන ලදි.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.03.28